**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘති - 01 - 2021**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947-එස්.ආර්.අයි සහ අංක 2948- එස්.ආර්.අයි (එස්.එෆ්) දරණ ව්‍යාපෘති ගිවිසුමේ පරිච්ඡේද II හි 2.10(a) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියට අනුව සහ වැඩසටහන ව්‍යාපෘති 01 හි ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘති 01 එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ව්‍යාපෘති 01 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ ව්‍යාපෘති 01 හි අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තුවේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ව්‍යාපෘති 01 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් හෝ සියයට 75ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් හෝ සියයට 25ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහනේ කාලපරිච්ඡේදය 2021 ජුනි 30 දක්වා තෙවරක් දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

---

2021 දෙසැම්බර 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වැඩසටහනේ ව්‍යාපෘති අංක 1 හ මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ තත්වයන් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් උසස් මට්ටමේ සහතිකවීමක් නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව සිදු කරන විගණනයේදී සැමවිටම පවත්නා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් ලබා නොදේ. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව විගණනය කිරීමේදී කොටසක් ලෙස මාගේ විගණන පුරාම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීම හා වෘත්තීය සැක මුසුව පවත්වා ගැනීම සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩ සටහනේ ව්‍යාපෘති 01 හි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාලත්වය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| අ) | 2021 වර්ෂයේ අන්තර් බිල්පත් ගෙවීම් අංක 28 වන විට අයි.සී.බී. 2 කොන්ත්‍රාත්කරු විසින් වැඩ පූර්ව අත්තිකාරම් සම්පූර්ණයෙන්ම නැවත අයකරනගෙන තිබුණි. කෙසේවෙතත් ඉන් රු.මිලියන 71.76 ක වැඩපූර්ව අත්තිකාරම් අගයක් මූල්‍ය ප්‍රකාශනවල අයවීම් ලෙස ගිණුම් තබා නොතිබුණි. | 71.76 | නිවැරදි කිරීමේ සටහන පසුව යොදන ලදී. | ගැටළුව නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ආ) | ණය අංක 2947 යටතේ මූලික අත්තිකාරම්වලින් ඇ.එ.ජ.ඩො.290,450 කට සමාන රු.මිලියන 54.92 ක වටිනාකමැති අත්තිකාරම් ඇවර කිරීම් සිදුකර ඇත. කෙසේවෙතත් එය ඇවර කිරීමෙන් පසුව අදාල ණය ගිණුමට මාරුකර නොමැත. | 54.92 | නිවැරදි කිරීමේ සටහන පසුව සටහන් කරන ලදී. | ගැටළුව නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 භෞතික ප්‍රගතිය**

වැඩසටහනේ ව්‍යාපෘති 01 හි භෞතික ප්‍රගති වාර්තාවට අනුව 2021දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතයේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 95.73 කි. කෙසේ වෙතත් සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගෙන ඇත්තේ සියයට 12.29 ක ප්‍රගතියක් පමණක් බවට නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ එක් එක් සංරචකවල සමුච්චිත කාර්ය සාධනය පහත පරිදි විය.

| | ක්‍රියාකාරකම | ඒකකයන් | අපේක්ෂිත ඉලක්ක | 2021 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ලඟා කර ගැනීම | විගණන ගැටළුව | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ උතුරු කොටසේ ආදායම් නොවන ජලය අඩුකිරීම සඳහා වන පද්ධති පුනරුත්ථාපනය (අයි.සී.බී.-1) | | | | සැලසුම් කරන ලද කොන්ත්‍රාත් කාලය තුල ආදායම් නොවන ජලය අඩුකර ගැනීම සඳහා වන පද්ධති පුනරුත්ථාපන කාර්යයන් සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම. එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් නොවන ජලයේ සියයට 18 අපේක්ෂිත ඉලක්කයට ලඟාවීම කෙරෙහි අවාසිදායක ලෙස බලපා ඇත. | නොවැලැක්විය හැකි අවස්ථාවන් හේතුවෙන්, සාධාරණය හේතු සලකමින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. කෙසේවෙතත් ආදායම් නොවන ජලය අපේක්ෂිත ඉලක්කයන් මේ වන විට ලඟා කරගෙන ඇත. | ප්‍රමාදයන් වැලැක්වීම සඳහා නිවැරදි කිරීමේ උපායයන් ගත යුතුය. |
| | නල ඇතිරීම් කාර්යයන් | මීටර් | 212,654 | 212,654 | | | |
| | සම්බන්ධතා මාරු කිරීම් (සම්පූර්ණ කරන ලද) | නිවාස හිමියන් | 35,176 | 35,106 | | | |
| | සම්පූර්ණ කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දෙන ලද දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ | ඒකක | 16 | 12 | | | |
| | සමස්ථ කොන්ත්‍රාත් කාර්ය සාධනයයි. | ප්‍රතිශතය | 100 | 99.51 | | | |
| (ආ) | කොළඹ නගරයේ නැගෙනහිර | | | | සැලසුම් කරන ලද කොන්ත්‍රාත් | නොවැලැක්විය විය හැකි | ප්‍රමාදයන් වැලැක්වීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කොටසේ ආදායම් නොවන ජලය අඩුකිරීම සඳහා වන පද්ධති පුනරුත්තාපනය (අයි.සී.බී.2) | මීටර් | 252,556 | 252.256 | කාලය තුල ආදායම් නොවන ජලය අඩුකර ගැනීම සඳහා වන පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම. එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් නොවන ජලයේ සියයට 18 ක අපේක්ෂිත ඉලක්කයට ලඟා වීම කෙරෙහි අවාසිදායක ලෙස බලපා ඇත. | අවස්ථාවන් හේතුවෙන් සාධාරණ හේතු සලකමින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. කෙසේවෙතත් ආදායම් නොවන ජලය අපේක්ෂිත ඉලක්කයන් මේ වන විට ලඟාකරගෙන ඇත. | සඳහා නිවැරදි කිරීමේ නිර්නායකයන් ගත යුතුය. |
| | නල ඇතිරීම් (ප්‍රධාන පෝෂක ඇතුළුව) | නිවාස හිමියන් | 27,314 | 24,722 | | | |
| | සම්බන්දතා මාරුකිරීම් (සම්පූර්ණයෙන් නිම කරන ලද) | ඒකක | 20 | 08 | | | |
| | සම්පූර්ණයෙන් නිම කරන ලද දිස්ත්‍රික් මිනුම් කලාප සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දීම් සමස්ථ කොන්ත්‍රාත් ප්‍රගතිය | ප්‍රතිශතය | 98.04 | 92.41 | | | |
| (ඇ) | මාලිගාකන්දෙහි ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ල ඉදිකිරීම | ප්‍රතිශතය | 100 | 99.2 | ව්‍යාපෘතිය නිම කිරීම කෙරෙහි අවාසිදායක ලෙස බලපා ඇත. | 2022 ජනවාරි 03 වන දින ගොඩනැගිල්ල භාර දී ඇත. | මෙම වාර්තාවේ 3.5 (බී)ඡේදයන් අනුව, ඉතිරි කාර්යයන් නිම කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් කළමණාකරණය**

| | විගණන ගැටළු | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ උතුරු කොටසේ ආදායම් නොවන ජලය අඩුකිරීම සඳහා වන පද්ධති පුනරුත්තාපන කොන්ත්‍රාත්තුව අයි.සී.බී. 01, 2018 ජුලි වන විට මාස 42 කින් නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව 2021 ඔක්තෝම්බර් 21 දක්වා අවස්ථා පහකදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත, සහ 2021 දෙසැම්බර් 31 දින වන විට පීඩන පරීක්ෂාවන් සමඟ නල එලීම් කාර්යයන් මීටර 212,654 ක් සහ නිවාස සම්බන්ධතා මාරු කිරීම් 35,106 ක් සම්පූර්ණයෙන්ම නිම කර තිබුනි. කෙසේ වෙතත් 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් ක්‍රියාකාරම් ආරම්භ කර මාස 83 කින් පසුව දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16 න් 12 ක් පමණක් සම්පූර්ණයෙන්ම නිමකර ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවහන මණ්ඩලය වෙත බාරදී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති ණය අවසන් කිරීමේ දිනය වන 2022 ජනවාරි 31 ඉක්මවා 2022 මාර්තු 15 දින දක්වා නැවත වතාවක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. | නොවැළැක්විය හැකි හේතූන් මත සාධාරණ හේතු සලකමින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු විය. සියලුම දිස්ත්‍රික් මිනුම් කලාප 16 සම්පූර්ණයෙන් නිම කර මෙහෙයුම් හා නඩත්තු අංශයට භාරදී ඇත. | ව්‍යාපෘති කාලය වන 2022 ජූනි 30 ට පෙර කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන්ම නිමකල යුතුය. |
| (ආ) | 2019 ජුලි වන විට කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා වන පද්ධති පුනරුත්තාන කොන්ත්‍රාත්තුව (අයි.සී.බී-2) මාස 48 කින් නිම කිරීමට සැලසුම් කර තිබුණි. අනතුරුව, කොන්ත්‍රාත් කාලපරිච්ජේදය 2022 ජනවාරි 21 දක්වා වාර 3 කින් දීර්ඝ කර තිබුණි. කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ පුනරුත්ථාපනයන් යටතේ ජල සැපයුම් ව්‍යාප්ත කිරීම සහ ආදායම් නොවන ජල ප්‍රතිශතය සියයට 18 ට අඩු කිරීම සඳහා දිස්ත්‍රික් මිනුම් කලාප 20 ක මීටර් 252,556 ක නල එලීම් කාර්යයන් සහ 27.314 ක සේවා සම්බන්ධතා මාරු කිරීම් මෙම කොන්ත්‍රාත්තුව යටතේ අපේක්ෂිත ඉලක්කයන් විය.<br><br>කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර මාස 77 ක් 2021 දෙසැම්බර් 31 දිනට ගතවී ඇතත්, සම්පූර්ණ කර තිබුණේ මීටර 252,256 ක නලඑලීම් හා සම්බන්ධතා මාරු කිරීම් 24,722 කි.<br>අපේක්ෂිත ආදායම් නොවන ජල ප්‍රතිශතයේ අපේක්ෂිත අඩුවීම ලඟා කර ගැනීමෙන් පසුව දිස්ත්‍රික් මිනුම් කලාප 20න් 8ක් පමණක් ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවහන මණ්ඩලය වෙත භාරදී ඇත. කෙසේ වෙතත් විධිමත් කාල දිගුවන් ලබා ගැනීමෙන් තොරව ණය ඇවර වන 2022 ජනවාරි 31 දිනය ඉක්මවා කොන්ත්‍රාත් කාර්යයන් කර ගෙන යන බවට නිරීක්ෂණය විය. | නොවැලැක් විය හැකි හේතූන් මත සාධාරණ හේතු සලකමින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු විය. දිස්ත්‍රික් මිනුම් කලාප 19 ක් සම්පූර්ණයෙන් නිම කර මෙහෙයුම් හා නඩත්තු අංශයට බාර දී ඇත. 2022 මැයි 21 දක්වා කාල දිගුව ලබා දී ඇත. | ව්‍යාපෘති කාලය වන 2022 ජූනි 30 දිනට පෙර කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන්ම නිම කල යුතුය. |

## 3.3 ක්ෂේත්‍ර පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණයන්

| | විගණන ගැටළුව | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් නව තොග ජල මනු ස්ථාපිත කිරීමට පවත්නා තොග ජල මනු අලුත්වැඩියා කිරීමට සහ භූගත ටැංකි අලුත්වැඩියා කිරීම ආදි කටයුතු කිරීමට සැලසුම් කර තිබුණි. නල එලීම් කාර්යයන් වලට අමතරව නිවාස සංකීර්ණ වලට සම්බන්ධතා මාරු කිරීම මගින්ද ආදායම් නොවන ජල ප්‍රතිශතය අඩු කර ගත හැකිය.<br><br>තනි තනි ජල මනු කියවීම් මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට වන ආදායම් ඉපයීම් සලකා බලන නමුත් තනි තනි ජල මනු කියවීම් වෙනුවට එක් එක් නිවාස සංකීර්ණවල තොග ජල මනු කියවීම් සැලකිල්ලට ගෙන ආදායම් නොවන ජලය ගණනය කිරීම් සිදු කරනු ලැබේ. භූගත ටැංකිවලින් වන කාන්දුවීම්, ඉහල පිහිටි ටැංකිවලින් වන කාන්දුවීම්, නීතිවිරෝධි සම්බන්ධතා ආදිය මත, තොග ජල මනු ගණනය කිරීම් සහ තනි ජල මනු ගණනය කිරීම් අතර වෙනස් වීම් නිරීක්ෂණය විය හැකිය.<br>කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් වෙනස්වීම් හඳුනාගැනීමට සහ එක් එක් පාරිභෝගිකයින්ගෙන් අයකිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බවට නිරීක්ෂණය විය.<br><br>එසේම භෞතික පරීක්ෂණ අවස්ථාවේදී අලුත්මාවත නිවාස සංකීර්ණයේ තොග ජල මනුව ක්‍රියාත්මක නොවන අතර, කටවලමුල්ල නිවාස සංකීර්ණයෙත් තොග ජල මනුව මාර්ග පුනස්ථාපනයන් හේතුවෙන් වැසීයාම මත කියවීම් ලබා ගත නොහැකි බවටත් නිරීක්ෂණය විය. එසේම සමගිපුර එක් නිවාස සංකීර්ණයක නිවාස හිමියන් 16 ක සම්බන්දතා මාරු කිරීම සඳහා ඔවුන්ගේ අනුමැතිය ලබා නොදීමද තවදුරටත් නිරීක්ෂණය විය. | තිරසාර නිවැරදි කිරීම් ක්‍රියාවක් ලෙස ඉදිරියේදී නිවාස සංකීර්ණ සඳහා සුවිශේෂි ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා බටහිර මධ්‍යම සහය සේවා මධ්‍යස්ථානයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත අප විසින් ඉල්ලීම් කර ඇත.<br>2022 ජනවාරි 20 දින සාමපුර ජේ කොටස සම්බන්ධයෙන් නිවසෙන් නිවසට දැනුවත් කිරීමේ වැඩසටහනක් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ හා ව්‍යාපෘති කළමණාකරණ ඒකකයේ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව 2022 පෙබරවාරි 24 දින මාලිගාකන්ද ප්‍රදේශයේ ඉංජිනේරුවරයා විසින් නිවාස හිමියන් සඳහා ලිපියක් යවන ලදී.<br><br>දෝෂ සහිත තොග ජල මනුව නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. | දැනුවත් කිරීමේ වැඩසටහනින් පසුව දෝෂයන් නිවැරදි කිරීමට සහ ඉතිරිවැඩ සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මල බැඳීම් වැලැක්වීම සඳහා යකඩ නල සම්බන්ධකිරීම් මැස්ටික් අමුද්‍රව්‍ය යොදා සම්පූර්ණයෙන් ආවරණය කල යුතුය. 2022 මාර්තු 11 වන දින අයි.සී.බී. 01 කොන්ත්‍රාත්තුවෙහි වරාය පරිශ්‍ර ආශ්‍රිත නල එලීම් භෞතිකව පරීක්ෂා කිරීමේදී මි.මී.1,000 මෘදු යකඩ නලයේ ඇණ හා මුරිච්චි සම්පූර්ණයෙන්ම ආවරණය කල යුතු නමුත් උඩ කොටසේ පමණක් මැස්ටික් යොදා තිබූ බවට නිරීක්ෂණය විය. | මැස්ටික් අමුද්‍රව්‍ය යොදා කාර්යයන් නිවැරදි කිරීම සඳහා කො ාන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී. පැරණි නල අක්‍රීය කිරීමේ කාර්යයන් කෙරීගෙන යමින් පවතී. පැරණි නල අක්‍රීය කිරීමේ කාර්යයන් කඩිනම් කිරීමට කොන්ත්‍රාත් | සංශෝධිත කාල රාමුව තුලදී පැරණි නල අක්‍රීය කිරීමේ කාර්යයන් සමීපව අධීක්ෂණය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මීට අමතරව පැරණි නල අක්‍රීය කිරීමෙන් පසුව ජලය කාන්දු වන අවස්ථා, දුර්වල මාර්ග පුනස්ථාපනයන් කිරීම හා නඩත්තු කිරීමේ දුර්වලතාවයන් නිසා ඒ.බී.සී. තට්ටුව සහ තාර කැඩී යාම් ද භෞතික පරීක්ෂණ අවස්ථාවේදී නිරීක්ෂණය විය. | කරුට උපදෙස් දෙන ලදී. | |
| (ඇ) | අයි.සී.බී 01 කොන්ත්‍රාත්තුව යටතේ ව්‍යාපෘතිය විසින් කිබුලා ඇල ප්‍රදේශයේ නල එළීම් කි.මී. 3.3 ක් සහ නිවාස සම්බන්ධතා 1,194 ක් සම්පූර්ණ කර ඇත. 2022 ජනවාරි 24 දින කිබුලා ඇල ප්‍රදේශයේ නල එළීම් සම්බන්ධයෙන් සිදු කරන්නට යෙදුන භෞතික පරීක්ෂාවට අනුව පුනස්ථාපන කාර්යයන් නිවැරදිව සිදු කර නොතිබුනි. එහි ප්‍රතිඵලයක් ලෙස ඒ.බී.සී. තට්ටුව කැඩී යාම් හා මාර්ග මතුපිට ඉරිතැලීම් නිරීක්ෂණය විය. මීට අමතරව ඉදිකිරීම් සිදුකර සැලකිය යුතු කාලයක් ගත වී තිබූ නමුත් බෝක්කු හරස් මාර්ග වල නල සම්බන්ධවීම් මැස්ටික් යොදා ආවරණය කර නොතිබූ අවස්ථා මීට අමතරව නිරීක්ෂණය විය. | සියළුම දෝෂයන් නිරීක්ෂණය විය. සියලුම දෝෂයන් නිවැරදි කිරීමට කොන්ත්‍රාත්නරුට උපදෙස් දෙන ලදී. දෝෂයන් නිවැරදි කිරීමෙන් අනතුරුව මාර්ග කොළඹ මහ නගර සභාවට භාර දෙන ලදී. | මෙවැනි වැරදි අනාගතයේ සිදුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ආදායම් නොවන ජලය සඳහා වූ මාලිගාකන්දෙහි වූ ගොඩැගිල්ලේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝම්බර් 23 වන විට මාස 18 කින් නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ඉදිකිරීම් කාලය 2022 මාර්තු 15 දක්වා හත් වතාවකින් දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් දැනටමත් මාස 18 වෙනුවට මාස 56 ක් ගත කර ඇති නමුත්, 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම්වල භෞතික කාර්ය සාධනය සියයට 99.02 ක් පමණක් විය. 2022 ජනවාරි 27 දින කොන්ත්‍රාත් කාර්යයන් සම්බන්දයෙන් සිදු කරන ලද භෞතික පරීක්ෂණයට අනුව ඉලෙක්ට්‍රිකල් කාර්යයන්, එල්.ඊ.ඩී. බල්බ ස්ථාපිත කිරීම් හා සවිකිරීම් ඇලුමිනියම් ජනේල හා දොරවල්වල කාර්යයන් වායුසමීකරණ කාර්යයන් නාන කාමරවල සවිකිරීම් කාර්යයන්, විද්‍යාගාරය සඳාහා ජලය සැපයුම් කිරීම, ටයිල් නිවැරදි කිරීම් කාර්යයන්, සිවිලිම් කාර්යයන්, කැඩිලින් කාර්යයන් ආදීන් සම්පූර්ණ කිරීමට තිබුණි. ඊට අමතරව 2022 ජනවාරි 27 දින වන විට බිම් මහලේ සැලකිය යුතු කාර්යයන් සම්පූර්ණ කිරීමට තිබුණි.<br><br>ඉහත කාර්යයන් සත්වන කාල දිගු දිනය වන 2022 මාර්තු 15 වන විටත් සම්පූර්ණ ලෙස නිම කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යය සාධනයට විවිධ හේතු බලපා ඇත. විශේෂයෙන් ඉහත සඳහන් කල කාලයතුල තිබූ වසංගත තත්වය මත වැඩබිම් සඳහා දුර්වල සේවක සහභාගිත්වය, වෙළඳපල තුල ගොඩනැගිලි ද්‍රව්‍යවල හිඟය (සිමෙන්ති, වැලි, කළුගල්. ක්ලැඩින් සීට්. සනීපාරක්ෂක සවිකිරීම්, ජනෙල් දොරවල්. කාර්යාල වෙන්කිරීම් සඳහා අවශ්‍ය ඇලුමිනියම් අමුද්‍රව්‍ය ආදී වශයෙන්) එල්.ඊ.ඩී. බල්බ සවිකිරීම් වැනි විදේශ උපකරණ ආනයනයේදී සිදුවූ ප්‍රමාදයන්, රට තුල ඩොලර් සංචිත හිඟතාවය මත වායු සමීකරණ ඒකක සහ ආශ්‍රිත ශ්‍රීතකාරක තඹ නල ගෙන්වීම.<br><br>කෙසේ වෙතත්, 2022 ජනවාරි 3 වන දින සය වන මහල සම්පූර්ණ කිරීමෙන් පසු ඇමතුම් මධ්‍යස්ථානයේ සමාරම්භක උත්සවය පැවැත්වීමට හැකි විය. | ඉතිරි කාර්යයන් සම්පූර්ණ කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 මතභේදයට තුඩු දුන් කරුණු

| | විගණන ගැටළුව | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණනගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයි.සී.බී - 02 කොන්ත්‍රාත්තුවෙහි විචලතා නියෝග යටතේ, රු.මිලියන 133.53 අගයක උපකොන්ත්‍රාත් 3 ක් බිම් සැකසුම් කාර්යයන් සඳහා ප්‍රධානය කර ඉන් රු.මිලියන 31.18 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවා ඇත. ඉන් රු.මි. 132.47 අගයක උපකොන්ත්‍රාත් වෙනත් ජල සම්පාදන ව්‍යාපෘතියක් යටතේ නිමකර ඇති මාලිකාකන්ද ජලාශයේ හා එලි හවුස් ජලාශයේ බිම් සැකසුම් කාර්යයන් සඳහා පමණක් ප්‍රධානය කර ඇත.ඒ අනුව පැරණි ජලාශ සඳහා විශාල පිරිවැය ඇස්තමේන්තුවක් සහ ගෙවා තිබූ රු.මි. 30.27 විගණනයේදී ගැටළුකාරී විය. ඊට අමතරව ඉහත ගෙවීම්වලින් සියයට 10 කට සමානවූ රු.මි. 3.11 ලාභ හා පොදුකාර්ය වියදම් ද ප්‍රධාන කොන්ත්‍රාතකරු විසින් කිසිදු කාර්යයක් නොකර අය කර ඇත. | වසර 100 ක් පැරණි නල ඉවත් කිරීම හා නව පොලි එතිලීන් නල ඇතිරීම මෙම ව්‍යාපෘතියේ විෂය පථය විය. මාලිගාකන්ද හා එලි හවුස් ජලාශ කොළඹ නගරයේ ප්‍රධාන ස්ථාන ආශ්‍රිතව පිහිටා ඇත. එසේම තවදුරටත් ජලාශ පරිශ්‍රයන් ප්‍රසන්න භාවයකින් හා අලංකාර ලෙස පවත්වාගෙන යාමට අදහස් කර ඇත. බිම් සැකසුම් සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හරිත සංකල්පය මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ලදී. එසේම මෙම පරිශ්‍ර විශේෂයෙන් පාසල් ළමුන්ගේ නැරඹුම් මධ්‍යස්ථානයන් වේ. එම නිසා මෙය අනාගතයේදී පැමිණීමට නියමිත ව්‍යාපෘති සඳහා වැදගත් වේ. | මෙවැනි කාර්යයන් සඳහා ණය අරමුදල් භාවිත නොකර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මන්ඩලයේ ඍජු ශ්‍රමය මඟින් සිදු කල යුතුය. |

## 3.5 ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම/ ක්‍රියාත්මක කිරීම/ අවසන් කිරීම ප්‍රමාද වීම.

| | විගණන ගැටළුව | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණනගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගුණාත්මක ජල සැපයුම් සේවාවක් කාර්යක්ෂම හා ඵලදායීව ලබා දෙමින් කොළඹ නගරයේ ආදායම් නොවන ජල ප්‍රතිශතය සියයට 49 සිට 2020 වන විට සියයට 18 අඩුකිරීම මහ කොළඹ ජල හා අපජල කළමණාකරණ වැඩිදියුණු කිරීම් ආයෝජන වැඩ සටහනේ අරමුණු විය. ඒ අනුව වැඩසටහන් ව්‍යාපෘති 01 මඟින් දිස්ත්‍රික් මීනුම් කලාප 36ක මීටර 450,508.26 ක නල ඇතිරීම කාර්යයන් හා නිවාස හිමියන් 60,143 කට අඩුකිරීම හා ජල සැපයුම් හා පද්ධති සම්බන්ධතා මාරු කිරීමට සහ කොළඹ නගරයේ උතුර හා නැගෙනහිර කොටස්වල | නොවැලැක්විය හැකි තත්වයන් මත සාධාරණ හේතු සලකා බලමින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු වී ඇත. නිරන්තර සක්‍රීය කාන්දුවීම් පාලන කාර්යයන් සමඟ දෛනිකව ආදායම් නොවන ජල කණ්ඩායම නිරන්තරයෙන් දිස්ත්‍රික් මීනුම් ප්‍රදේශ අගයන් නිරන්තරයෙන් නියාමනය කරනු ලැබේ. ආදායම් නොවන ජලය අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. කොළඹ නගරයේ වර්තමාන ආදායම් නොවන | ව්‍යාපෘතිය නිම කිරීමට නිවැරදි කිරීමේ කාර්යයන් තවදුරටත් ප්‍රමාද නොකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුනරුත්තාපනයන් යටතේ ආදායම් නොවන ජලය අඩු කිරීම සහ ජල සැපයුම් පද්ධතිය වර්ධනය කිරීම් ඇතුලත් විය. 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කටයුතු ආරම්භ කර වසර 08 කට පසුව නල එලීම් කාර්යයන් සහ නිවාස සම්බන්ධතා මාරු කිරීම් සැලකිය යුතු ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇතිමුත් ආදායම් නොවන ජලය අපේක්ෂිත මට්ටම ලඟාවීමෙන් අනතුරුව දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 36 න් 20 ක් පමණක් සම්පූර්ණ කර 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයට භාර දී ඇත. කෙසේ වෙතත් අවසාන කාල දිගුවට අනුව වැඩසටහනේ ව්‍යාපෘති 01 හි ව්‍යාපෘති කාර්යයන් සහ ණය ඇවර කිරීමේ කාලය පිළිවෙලින් 2021 ජුනි 30 හා 2022 ජනවාරි 31 කල් ඉකුත් වේ. එම නිසා ව්‍යාපෘතියේ ඉතිරි කාර්යයන් වැඩසටහන් ව්‍යාපෘති 03 හි ව්‍යාපෘති වැඩසටහන් අතිරේක මූල්‍යයයන් යටතේ සිදු කිරීමට නියමිතය. කෙසේ වෙතත් 2021 දෙසැම්බර් 31 දිනට කොළඹ නගරයේ ආදායම් නොවන ජල අගය සියයට 34.75 ක් ව පැවතිණි. ඒ අනුව 2021 වර්ෂය වන විටත් ආදායම් නොවන ජලයෙහි අපේකෂිත ඉලක්කයට ලඟා වී නොමැත. | ජල අගය සියයට 25 ට අඩු වී ඇත. | |
| (ආ) | ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ල මහල් 06 කින් සමන්විත විය. කෙසේ වෙතත් අභ්‍යන්තර කාර්යයන් ආරම්භ කල පසු විද්‍යාගාරයේ, ශ්‍රවණාගාරයේ හා ඇමතුම් මධ්‍යස්ථානයේ මූලික බිම් සැකසුම් වෙනස් කර තිබිණි. බිම් සැකසුම් වෙනස් කිරීමේ ප්‍රතිපලයක් ලෙස කොටස් කිරීමේ කාර්යයන්, වායු සමීකරන සැලසුම් කාර්යයන් පැන්ට්‍රි කබඩ් ස්ථානගත කිරීම්, ටයිල් කාර්යයන් සහ විදුලි ජනක යන්ත්‍ර ධාරිතාවයන් ද සමගාමීව වෙනස් කර ඇත. ඒ අතරින් කොටස් කිරීමේ කාර්යයන් සඳහා ඇස්තමේන්තු විචලතාවය හා පැන්ට්‍රි කබඩ් ස්ථානගත කිරීමේ පිරිවැය පිළිවෙලින් රු.මි.7.42 හා රු.මි. 2.96 ක් විය. අන්තර බිල්පත් ගෙවීම් අංක 29 වන විට ඉන් සියයට 90ක් ගෙවා තිබුණි. ඊට අමතරව සම්පූර්ණ ගොඩනැගිල්ල බාහිර පින්තාරු කිරීමේ කාර්යයන් වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු.මි. 8.52 ක් ගෙවා ඇත. තීන්ත ආලේප කර ඇති ප්‍රදේශය ආවරණය වන පරිදි ගොඩනැගිල්ලේ ඉදිරි පස කැඩලින් කාර්යයන් සඳහා රු.මි.24.7 ක් ව්‍යාපෘතිය විසින් ඇස්තමේන්තු කර ඇත. එම නිසා මූලිකව ගාඩනැගිල්ලේ කැඩලින් | මහල් 04ක් සඳහා පමණක් ටෙන්ඩර් අදියර ඇදීම් අනුව පළමු මහලේ නැවතීමේ පහසුකම් සහ පරීක්ෂණ මට්ටමේ ස්ථාපිත කිරීම් සහ ඉතිරිය හිස් අවකාශ ලෙස කාර්යාල කොටස් කිරීම් ඇද තිබුණි.<br>කෙසේදයත්, හිස්බිම් අවකාශ සඳහා මිල ප්‍රමාණ පත්‍ර සාමාන්‍ය වෙන් කිරීම් යටතේ වර්ග කෙරිණි. ජාතික ජල සම්පාදන හා ජලාපහන මණ්ඩල ජලාපවහන ඉල්ලීමට අනුව පසුව භාර දෙන ලද කාර්යාල සැලැස්ම සඳහා ඊ එල්වී පද්ධතිය , ගිණි නිවීම් පද්ධතිය ආදී ලෙස වෙනස්වීම්වලට ලක් විය.<br><br>2021 ජුනිවල සිදුකරන ලද ඉහල කළමණාකරණයේ නිරීක්ෂණයන්ට අනුව, එදින සිට මෙම ගොඩනැගිල්ල ආදායම් නොවන ජලය අධීක්ෂණය හා පාලනය සම්බන්ධයෙන් ජාතික මධ්‍යස්ථානයක් වන බැවින් | ගොඩනැගිලි භාවිතා කරන අරමුණට අනුව සැලසුම් කිරීම සිදුකළ යුතුය. කොන්ත්‍රාත් ප්‍රමාණය කල පසු සහ ඉදිකිරීම් අදියරේදී ඇතිවන වෙනස්වීම් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| කාර්යයන් තීරණය කලේ නම් පින්තාරු වියදම් වලින් යම් ප්‍රමාණයක් ඉතිරිකර ගත හැකිව තිබූ බවට නිරීක්ෂණය විය. ගොඩනැගිලි නිර්මාණකරණ අතිරේක වියදම්වලට අමතරව අභ්‍යන්තර හා බාහිර නිර්මාණකරණයන්ගේ ප්‍රමාදයන් ද ගොඩනැගිල්ල සම්පූර්ණකිරීමේ ප්‍රමාදයන්ට විශේෂයෙන් බලපා ඇති බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය. | තවදුරටත් ගොඩනැගිල්ලේ බාහිර හා අභ්‍යන්තර පෙනුම වැඩිදියුණු කිරීමට උපදෙස් දෙන ලදී. | |

**3.6 පද්ධති හා පාලනයන්**

| විගණන ගැටළුව | | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට නැවත අයකර නොගත් ආරක්ෂණ තැන්පතුවල වටිනාකම රු.මිල 109.83ක් විය.<br>කොළඹ මහනගර සභාවට භාර දෙන ලද මාර්ග සම්බන්ධයෙන් රු.මි.66.08 ක ආරක්ෂක තැන්පතුවල දෝෂ වගකීම් කාලය ඉක්මවා ගොස් තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී කිසිඳු වටිනාකමක් කොළඹ මහ නගර සභාවෙන් නැවත අයකර ගෙන නොතිබුණි. | සියලුම ලියකියවිලි බාරදීමෙන් පසුව කොළඹ මහ නගර සභාව විසින් ගොඩනගන ලද ඇදීම් සටහන් වල මෘදු පිටපත් ඉල්ලීම් කර තිබුණි. අප විසින් ඒවා භාර දෙන ලදී. එසේම ගොඩනගන ලද ඇදීම් සටහන් ලැබීමෙන් පසුව නැවත අයකර ගත හැකි තැන්පත් ප්‍රතිපූර්ණය කිරීමට කොළඹ මහනගර සභාව එකඟ වී ඇත. | ප්‍රමාදයකින් තොරව ආරක්ෂක තැන්පත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 24 දින ඇලකන්ද සහ මාකොල පයිප්ප අංගනවල සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව පොලි එතලීන් සහ මෘදු යකඩ නල නියමිත ප්‍රමිතියට අනුව ගබඩාකර නොතිබූ බවට හා පොලි එතලීන් නල පාරජම්බුල කිරණවලින් වළක්වා ගැනීමට ආරක්ෂක දැලකින් ආවරණ කර නොතිබූ බවට නිරීක්ෂණය විය. | අමුද්‍රව්‍ය ගබඩාකිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කරන ලෙස කොන්ත්‍රාත්කරුට දැනටමත් උපදෙස් ලබා දී ඇත. කොන්ත්‍රාත්කරු ඒ අනුව කටයුතු කර ඇත. | නියමිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් නල ගබඩාකරනවාද යන්න සමීපව නිරීක්ෂණය කිරීමට කොන්ත්‍රාත්කරුවන්ගේ ගබඩා අධීක්ෂණය කල යුතුය. |
| (ඇ) | සියලුම බැඳුම්කර හා වගකීම් සඳහා රු.මි. 17 ක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, 2021 මාර්තු 25 වන විට සත්‍ය ගෙවීම් රු.මි. 131.68 ක් වේ. ඉන් රු.මි.70.23 ක් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමකින් තොරව ගෙවා ඇත. | මෙම ගෙවීම වෙන් කල ප්‍රතිපාදන යටතේ ගෙවීම් සඳහා සාමාන්‍ය අධිකාරී විසින් (කොන්ත්‍රාත් ඉංජිනේරු) පත්කල කමිටුවක් විසින් අදාල සියළු කරුණු සලකා බලා නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව මිල ප්‍රමාණ පත්‍ර අයිතම 2.01 යටතේ මෙම ගෙවීම් කරන ලදී. | අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගෙවීම් සිදුකිරීම සහතික කිරීමට යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය. |

| | | |
|---|---|---|
| | ප්‍රමාද ගාස්තු ගෙවීම් කිරීම වලක්වා ගැනීම සඳහා මෙම ගෙවීම් සිදුකරන ලදී. | |
| (ඉ) 2010 ජුලි 26 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛණය ප්‍රකාරව, වැඩසටහන් ව්‍යාපෘති අංක 1 හි කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කර නොමැත. | 2022 වර්ෂයේදී එය සිදු නොකරන ලදී. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |